// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2475/08 - 2026 පෙබරවාරි මස 10 වැනි අඟහරුවාදා - 2026.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : KDS/HAR/4/2/1/58.
*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2022/WS/56.

මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ කුළුගම්මන පොම්පාගාරය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:-*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව සුළු කොට්ඨාසයේ අංක 447, කුළුගම්මන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කුළුගම්මන ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙළ කරන ලද අංක 320505 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 07 හි පත්‍ර අංක2 හි ඉ.වි.ලැ 1 හි කැබලි අංක 1 ලෙස දැක්වෙන පහත විස්තර සඳහන් ඉඩම් කොටසට මායිම් :

01. කැබලි අංක 01

ඉඩමේ නම: පන්සල්වත්ත *නොහොත්* පන්සල් අරඹ, වලකඩවත්ත කුඹුර, කජුගහකොටුව, වලකඩවත්ත අරඹ සහ බිලිංවගහකොටුව; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: කුළුගම්මන විහාරයේ විහාරාධිපති පූජ්‍ය ඇකිරියේ සද්ධානන්ද හිමි සහ කොළඹ මහාභාරකාර දෙපාර්තමේන්තුවේ මහභාරකාරතුමා; ප්‍රමාණය: හෙක්. 0.0072.

*උතුරට* : කැබලි අංක 2 සහ පත්‍ර 1 හි කැබලි අංක 1; *නැගෙනහිරට* : පත්‍ර 1 හි කැබලි අංක 1 සහ 3; *දකුණට* : පත්‍ර 1 හි කැබලි අංක 3 සහ මෙම පිඹුරේ කැබලි අංක 2; *බටහිරට* : කැබලි අංක 2.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026 මාර්තු මස 23 වැනි දින පෙ. ව. 10.00 ට හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026 මාර්තු මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**මොහාන් ධර්මදාස,**
ප්‍රාදේශීය ලේකම්,
හාරිස්පත්තුව.

2026 ජනවාරි මස 30 වැනි දින,
හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0077

1A - G 046268 - 31 (2026/02)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 3/2/3/10/276.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2019/
එම්ඩබ්ලිව්/186.

නිට්ටඹුව පස්යාල මාර්ග ව්‍යාපෘතිය සඳහා අංක 2254/27 දරන 2021 නොවැම්බර් මස 17 වැනි බදාදා දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* 15ඒ පිටුවෙහි භාෂාත්‍රයෙන් පළ කරන ලද සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද 2021.09.01 දිනැති හා කැඩැස්තර සිතියම් අංක 510607 හි කලාප 01 පත්‍ර අංක 16 හි කැබලි අංක 513, 514 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2168 ක් වූ ඉඩමේ පහත සඳහන් කැබලි අංක පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 513**
ඉඩමේ නම: දෙල්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්, සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් සහ වැසිකිළියක් ඇත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: නිට්ටඹුව, නුවර පාරේ අංක 47 හි පදිංචි යූ.පී.සී. ජයනන්දන, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා; ප්‍රමාණය: හෙක්. 0.0313.

02. **කැබලි අංක 514**
ඉඩමේ නම: දෙල්ගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: නිට්ටඹුව, නුවර පාරේ අංක 47 හි පදිංචි යූ.පී.සී. ජයනන්දන, මූලික පිඹුර සම්පූර්ණ කිරීම සඳහා කැබලි අංක යොදන ලදි; ප්‍රමාණය: හෙක්. 0.1855.

**එස්. පී. ගුණවර්ධන,**
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

2026 ජනවාරි මස 30 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0078

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DIVMH/LND/ACQUR/9/13/6A.

අංක 2274/28 හා 2022/04/08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයෙහි 3ඒ පිටුවෙහි සහ 2022 සැප්තැම්බර් මස 15 දින ප්‍රකාශ කළ දිනමිණ, ඩේලිනිවුස්, තිනකරන් පුවත්පත්වල පළ කරන ලද 142 කිරිමැටියාව ග්‍රාම නිලධාරි වසමේ තලන්ගෙදර ගමෙහි අවසාන ගම් පිඹුරු අංක 3691 හි අතිරේක 02 හි පත්‍ර 02 හි කැබලි අංක 173 කෝන්ගහමූලයාය නැමති හෙක්ටයාර් 0.6943 කොටස පිඹුර සම්පූර්ණ කිරීම සඳහා කැබලි අංක යොදන ලද බැවින් වයඹ පළාත් මහ ඇළ සඳහා අත්කර නොගන්නා බවත් ඉහත සඳහන් කරන ලද *ගැසට් පත්‍රයේ* පිටු අංක 6ඒ සහ පුවත්පත් දැන්වීම්වල සඳහන් කරන ලද *ගැසට් පත්‍රයේ* පිටු අංක 6ඒ සහ පුවත් පත් දැන්වීම්වල සඳහන් 142 කිරිමැටියාව ග්‍රාම නිලධාරි වසමේ කිරිමැටියාව ගමෙහි ගම් පිඹුරු අංක 3683 හි අතිරේක අංක 25 හි පත්‍ර අංක 25 හි කැබලි අංක 850 උණගහයාය, බෝගහමුලහේන නැමති හෙක්ටයාර් 0.0476 කොටස වෙන්වී ගිය බිම් කොටසක් බැවින් වයඹ පළාත් මහ ඇළ සඳහා අත්කර නොගන්නා බවත් මෙයින් ප්‍රකාශ කරමි.

**බී. එම්. නදුන් ආර්. සම්පත්,**
ප්‍රාදේශීය ලේකම්,
මහව.

2026 පෙබරවාරි මස 02 වැනි දින,
මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0079

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.